**ශීර්ෂය 223 - ශ්‍රී ලංකා නාවික හමුදාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

ශීර්ෂය 223 - ශ්‍රී ලංකා නාවික හමුදාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ගබඩා අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජූලි 19 දින නාවික හමුදාපතිවරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

විසර්ජන ගිණුම, ගබඩා අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

ශ්‍රී ලංකා නාවික හමුදාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 61,924.87 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 56,734.62 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 5,190.25 ක් හෙවත් සියයට 8.38 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 48,730.50 | 46,874.21 | 1,856.29 | 3.81 |
| මූලධන | 13,194.37 | 9,860.41 | 3,333.96 | 25.27 |
| **එකතුව** | **61,924.87** | **56,734.62** | **5,190.25** | **8.38** |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 04 ක්, දෙපාර්තමේන්තුවක් හා කාර්යාලයක් විසින් එකතුව රු.මිලියන 1,965.24 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,746.32 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 218.92 ක් හෙවත් සියයට 11.14 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

ශ්‍රී ලංකා නාවික හමුදාවට අදාළ විෂය අංක 22301 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 600.00 | 547.27 | 510.44 | 589.15 | 900.00 | 300.92 |

### 2.2.2 ගබඩා අත්තිකාරම් ගිණුම

ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් විෂය අංක 22302 දරන පුපුරණ ද්‍රව්‍ය, ගිනිඅවි හා පතොරොම් විකිණීම පිළිබඳ ගබඩා අත්තිකාරම් ගිණුමක් පවත්වා තිබුණි.

**(අ) පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් පවත්වා තිබුණු පුපුරණ ද්‍රව්‍ය, ගිනිඅවි හා පතොරොම් විකිණීම පිළිබඳ ගබඩා අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 480.00 | 475.09 | 450.00 | 567.92 | 390.00 | 127.94 |

(ආ) මූල්‍ය ප්‍රතිඵල

විෂය අංක 22302 දරන පුපුරණ ද්‍රව්‍ය, ගිනි අවි හා පතොරොම් විකිණීම පිළිබඳ ගබඩා අත්තිකාරම් ගිණුමේ මූල්‍ය ප්‍රතිඵල පහත පරිදි විය.

| අත්තිකාරම් ගිණුම් කටයුත්ත | මූල්‍ය ප්‍රතිඵල 2016 | | 2015 | |
|---|---|---|---|---|
| | ලාභය කල්පිත ගාස්තු රහිතව | ලාභය කල්පිත ගාස්තු සහිතව | ලාභය කල්පිත ගාස්තු රහිතව | ලාභය කල්පිත ගාස්තු සහිතව |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| පුපුරණ ද්‍රව්‍ය, ගිනිඅවි හා පතරොම් විකිණීම | 125.42 | 101.47 | 108.67 | 86.90 |

## 2.3 අග්‍රිම ගිණුම

ශ්‍රී ලංකා නාවික හමුදාවේ 2016 දෙසැම්බර් 31 දිනට අංක 7002/0000/00/0029/0016/000 දරන අග්‍රිම ගිණුමේ ශේෂය රු.මිලියන 14.02 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම

ශ්‍රී ලංකා නාවික හමුදාවේ 2016 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම් 04 කට අදාළ ශේෂවල එකතුව රු.මිලියන 248.47 ක් විය. විස්තර පහත දැක්වේ.

| ගිණුම් අංක | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0065/000 | 0.19 |
| 6000/0000/00/0002/0083/000 | 1.92 |
| 6000/0000/00/0013/0055/000 | 214.50 |
| 6000/0000/00/0016/0035/000 | 31.86 |
| **එකතුව** | **248.47** |

## 2.5 විගණන නිරීක්ෂණය

ශ්‍රී ලංකා නාවික හමුදාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ගබඩා අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති කළමණාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (i) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |
| (ii) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| (iii) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 |

3.2 විසර්ජන ගිණුම

3.2.1 අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 37 කට අදාළව අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් එම වැය විෂයයන්ගේ ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිවීම්, සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. එයින් රු.මිලියන 3,333.97 ක මූලධන ඉතිරිවීම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉන්දියානු ආනයන හා අපනයන බැංකු ණය ප්‍රතිපාදන මත 2013 වර්ෂයේදී ඇ.ඩො.මිලියන 133.10 ක් පිරිවැයට නවීන වර්ගයේ සාගර මුර යාත්‍රා දෙකක් මිලදී ගැනීමට ශ්‍රී ලංකා නාවික හමුදාව ඉන්දියානු සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. 2017 ජූනි මාසය වන විට ඒ සඳහා ඇ.ඩො.මිලියන 99.82 (රු.මිලියන 33,656) ක් ගෙවා තිබුණි. ගිවිසුම ප්‍රකාරව 2017 අගෝස්තු 02 දින වන විට එක් නාවික යාත්‍රාවක් ලැබී තිබුණි. අනෙක් නාවික යාත්‍රාව 2018 පෙබරවාරි මාසය තුළ ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත ලැබීමට නියමිතව තිබුණි. නාවික හමුදාපතිවරයාගේ පැහැදිලි කිරීම අනුව 223-1-2-2502(12) දරන වැය විෂය යටතේ 2016 වර්ෂය සඳහා නාවික හමුදාව විසින් රු.මිලියන 7,040 ක ප්‍රතිපාදන අයදුම් කර තිබුණත්, 2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් එම වැය විෂය යටතේ රු.මිලියන 8,145 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එමෙන්ම නෞකා නිෂ්පාදන ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේදී සැලැසුම් කළ නිෂ්පාදන ඉලක්ක සපුරාලීමට නොහැකිවීම නිසා සලසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 2,355 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු බව සඳහන් කර තිබුණි. 2016 නොවැම්බර් 30 දින නෞකා නිෂ්පාදන ආයතනය විසින් ඉදිරිපත් කර තිබුණු බිල්පත 2016 වර්ෂයේදී පියවා නොතිබුණි. එමෙන්ම එම බැරකම විසර්ජන ගිණුමෙන් හෙළිදරව් කිරීමද කර නොතිබුණි. එම බැරකම වූ රු.මිලියන 1,009 ක් 2017 ජනවාරි 17 දින ගෙවා තිබුණි.

(ii) කාර්ය නිම කර තිබුණත්, අක් මුදල් නොලැබීම නිසා රු.මිලියන 581 ක බිල්පත් පියවා නොතිබුණු අතර, නෞකා මිලදී ගැනීම වෙනුවෙන් දේශීය නියෝජිත ගාස්තු ඉදිරිපත් නොවීම නිසා රු.මිලියන 38 ක්ද, ඉතිරි වී තිබුණි. නාවික හමුදාව විසින්

ඉල්ලුම් කළ ප්‍රතිපාදන ප්‍රමාණයට වඩා ප්‍රතිපාදන ලබා දීම නිසා රු.මිලියන 317 ක ප්‍රතිපාදන හා වෙනත් විවිධ හේතු නිසා රු.මිලියන 43 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉතිරි වී තිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 29 දිනැති අංක 7/2015 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2 ඡේදය ප්‍රකාරව 2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවල වැය විෂය සංකේත 1202- ඉන්ධන ප්‍රතිපාදනයෙන් සියයට 15 ක් හෙවත් රු.මිලියන 476ක් හා වැය විෂය සංකේත 1401- ප්‍රවාහන ප්‍රතිපාදනයෙන් සියයට 10 ක් හෙවත් රු.මිලියන 24ක අනිවාර්ය ඉතිරි කිරීමක් කළ යුතු බවට උපදෙස් ලබාදී තිබුණත්, පිළිවෙලින් රු.මිලියන 11ක් හා රු.මිලියන 7ක් පමණක් ඉතිරි කර තිබුණි.

(ඇ) පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මඟින් අවශ්‍ය ප්‍රමාණය ඉක්මවා ප්‍රතිපාදන ලබා ගැනීම නිසා, ලබාගත් ප්රතිපාදනවලින් උපයෝජනය කළ පසු ඉතිරිය සියයට 50 කට වැඩි ප්‍රමාණයක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වැය විෂය | පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් මඟින් ලබාගත් ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| 223-1-1-4-2502 | 3,500,000 | 475,000 | 3,025,000 | 86.43 |
| 223-1-3-2101 | 22,791,261 | 11,395,630 | 11,395,631 | 50.00 |

(ඇ) වැය විෂයයන් 15 කට අදාළව සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා රු.322,518,552 ක බැරකම්වලට එළඹ තිබුණි.

## 3.3 අග්‍රිම ගිණුම

මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්යය නිමකළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, කාර්යය නිමවී දින 30 ක සිට දින 190 ක් දක්වා වූ කාල ප්‍රමාදයකින් පසුව අතුරු අග්‍රිම නිරවුල් කර තිබුණි.

## 3.4 පොදු තැන්පත් ගිණුම

වර්ෂ 2 ක් ඉක්මවූ රු.63,972,649 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 22301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ඉදිරිපත් කරන ලද සැසඳුම් ප්‍රකාශය අනුව 2016 දෙසැම්බර් 31 දිනට පාලන ගිණුමේ ශේෂය රු.300,921,421 ක් වූ අතර එදිනට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව රු.259,349,239 ක් විය. ඒ අනුව රු.41,572,182 ක වෙනසක් අනාවරණය වී තිබුණත්, එය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සසඳා නිවැරදි කර නොතිබුණි.

එසේම පසුගිය වර්ෂ 12 ක කාලයක සිට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව පාලන ගිණුමේ දැක්වෙන ශේෂය සමඟ සැසඳීම් කර නොතිබුණු බව විගණනයේදී පෙන්වා දී තිබුණි.

(ආ) 2016 වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ සේවක ණය කාල විශ්ලේෂණය අනුව වර්ෂ 5 කට වඩා වැඩි කාලයක් සිට පැවත එන හිඟහිටි ණය ශේෂය රු.5,100,278 ක් විය.

### 3.6 ගබඩා අත්තිකාරම් ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් පුපුරණ ද්‍රව්‍ය, ගිනි අවි හා පතොරොම් විකිණීම පිළිබඳ ගබඩා අත්තිකාරම් ගිණුමේ කටයුතු ඉටුකර තිබුණි. පොටෑසියම් ක්ලෝරේට් හා රතු පොස්පරස් පිළිවෙලින් රු.මිලියන 23.6 ක් හා රු.මිලියන 18.4 ක් වැය කර මිලදී ගෙන තිබුණු නමුත් කාර්මික තාක්ෂණ ආයතනය විසින් සිදු කරනු ලබන තත්ත්ව පරීක්ෂණ වාර්තාව පදනම් කරගෙන මිලදී ගැනීම සිදු කළ යුතුව තිබුණත්,එසේ සිදු නොකර සැපයුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තත්ත්ව පරීක්ෂණ වාර්තා පදනම් කරගෙන මිලදීගැනීම සිදු කර තිබුණි.

(ආ) ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 387 ක මිලදී ගැනීම් සිදුකර තිබුණි. ඒ මිලදී ගැනීම් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ප්‍රසම්පාදන කාලසටහනකට අනුව මිලදී ගැනීම් සිදු කර නොතිබුණි.

### 3.7 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

#### 3.7.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2016 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් පිළියෙල කර තිබුණද, ක්‍රියාකාරී සැලැස්මක තිබිය යුතු මූලික අවශ්‍යතාවයන් වන කාර්යය ඉටුකිරීම සඳහා වගකිව යුතු නිලධාරීන් සහ වාර්ෂික අයවැය ප්‍රතිපාදන එක් එක් කාර්යයන් අතර උපයෝජනය කරන ආකාරය එහි අන්තර්ගත කර නොතිබුණි.

#### 3.7.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2016 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණු නමුත්, ප්‍රසම්පාදන කාලසටහනක් සකස් කර නොතිබුණු බැවින් එය ක්‍රියාත්මක සැලැස්මක් වශයෙන් යොදාගෙන නොතිබුණි..

**3.8 වත්කම් කළමනාකරණය**

ශ්‍රී ලංකා නාවික හමුදාවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 1995 වර්ෂයේ සිට 1997 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ පිළිවෙලින් රු.239,969,891 ක් වටිනා මැෂින් තුවක්කු (Machine Gun) 101 ක් හා රු.47,971,847 ක් වටිනා ගුවන් යානා තුවක්කුවක් (Anti – Aircraft Gun) මිලදී ගෙන තිබුණත්, එම අවි ආයුධ පාවිච්චි කළ නොහැකි තත්ත්වයට පත්වී තිබුණි. එම අවි ආයුධ පරීක්ෂණ මණ්ඩලයක නිර්දේශ ලබාගෙන අපහරණය කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

(ii) ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානයේ වාහන අංගනය තුළ ගර්හිත වාහන 74 ක් පැවති අතර ඉන් වාහන 07ක් වර්ෂ 05 කට වැඩි කාලයක් ද, වාහන 06 ක් වර්ෂ 04 කට වැඩි කාලයක් ද, වාහන 16 ක් වර්ෂ 02 කට වැඩි කාලයක් ද, ගර්හිත තත්ත්වයේ පැවතුණි.

(iii) 2016 වර්ෂය අවසානය වන විටත් භාවිතා (නිකුත්) නොකරන ලද තොග විෂයයන් ගණනාවක් දකුණු නාවික විධානයේ නිෂ්කාර්ය ලෙස ගබඩා කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ස්ථානය | තොග විෂයය | තොග විෂයයන් ගණන | වටිනාකම<br>රු. | භාවිතා නොකරන ලද කාලය |
| --- | --- | --- | --- | --- |
| වාහන අමතර කොටස් ගබඩාව | වාහන අමතර කොටස් | 280 | 476,876 | 2005 වර්ෂයේ සිට |
| විදුලි හා ඉලෙක්ට්‍රොනික් ගබඩාව | මාලිමා යන්ත්‍රය | 01 | 186,862 | 2005 වර්ෂයේ සිට |
| වාහන අමතර කොටස් ගබඩාව | වාහන අමතර කොටස් | 192 | 370,304 | වර්ෂ 6 ක සිට වර්ෂ 9 ක් දක්වා |
| වාහන අමතර කොටස් ගබඩාව | වාහන අමතර කොටස් | 78 | 178,470 | වර්ෂ 5 කට වැඩි |

(iv) උතුරු නාවික විධානයට අයත් ගබඩා තුළ රු.32,801,226 ක් වටිනා තොග විෂයයන් 2062 ක් දීර්ඝ කාලයක සිට නිකුත් නොකර නිෂ්කාර්ය ලෙස ගබඩා කර තිබුණි.

(v) 1999 වර්ෂයේදී ස්ටර්ලින් පවුම් 2,028,000 ක් ගෙවා මිලදීගත් නෞකාවක් වර්ෂ 03 කට අධික කාලයක සිට වයඹ නාවික විධානයේ ගර්හිත තත්ත්වයේ පවතින අතර එය අපහරණය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**(ඇ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් වෙනත් ආයතන සතු පහත සඳහන් වත්කම් විධිමත් පරිදි පවරා නොගෙන ශ්‍රී ලංකා නාවික හමුදාවේ කාර්යයන් සඳහා යොදවා ගෙන තිබුණි.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | වටිනාකම |
|---|---|---|---|
| | | | රු. |
| (i) | ඉඩම් (අක්කර) - රජයේ | 4,386.43 | වටිනාකම තක්සේරු කර නැත |
| | - පෞද්ගලික | 764.30 | 340,006,000 |
| | | 670.48 | වටිනාකම තක්සේරු කර නැත |
| (ii) | ගොඩනැගිලි | 219 | 299,546,200 |
| (iii) | මෝටර් වාහන | 38 | 371,997,308 |
| | | 17 | වටිනාකම තක්සේරු කර නැත. |

## 3.9 අනුකූල නොවීම

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ව්‍යවස්ථාපිත විධිවිධාන** | | |
| (i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 ව්‍යවස්ථාව | 1,179,300 | නාවික හමුදාවට අයත් සිවිල් ආපනශාලා බඳු දීමෙන් ලැබෙන ආදායම ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ii) | 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතෙහි 2 (අ) උප වගන්තිය | 4,302,148 | ආනයනය කරන ලද භාණ්ඩ විකිණීමේදී මුළු විකුණුම්වලින් සියයට 2 ක බද්දක් අයකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළයුතු වුවත්, ජාතිය ගොඩනැගීමේ බදු ගණනය කිරීමේ දෝෂයක් හේතුවෙන් රු.4,302,148 ක් අඩුවෙන් බදු ගෙවා තිබුණි. |

**(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

-----------------------------------

| | | | |
|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 137 | 25,973,758 | අනුමැතියක් ලබා නොගෙන අවස්ථා 37 කදී රු.මිලියන 25.9 ක විදුලි බිල්පත් නිරවුල් කර තිබුණි. |
| (ii) | මුදල්රෙගුලාසි - 1653 | 3,097,653 | උතුරු මැද නාවික පෙදෙසට අයත් වාහන 06 ක වේගමාන මීටර් ක්‍රියා විරහිතව තිබුණද, අනුමාන පදනම මත කිලෝ මීටර් 32,077 ක් ධාවනය කර තිබුණු අතර ඉන්ධන සඳහා රු.3,097,653 ක් වැය කර තිබුණි. මෙම වාහනවල වේගමාන මීටර් අළුත්වැඩියාව සඳහා මෝටර් ප්‍රවාහන වැඩපල වෙත යොමු කර තිබුණද, විවිධ හේතු දක්වා අළුත්වැඩියාවන් සිදු කර නොතිබුණි. |
| (iii) | මුදල්රෙගුලාසි 1653 | | දකුණු නාවික පෙදෙසෙහි වේගමාන මීටර් අක්‍රියව වාහන 32 ක් ධාවනයේ යොදවා තිබුණි. |

## 3.10 අවිධිමත් ගනුදෙනු

-------------------

ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොරවිය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

-----------------------------------------------------------------

ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් සිදු කර තිබුණු ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් කරන ලද නියැදි විගණන පරීක්ෂණවලදී සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.11 (ආ) (iii) මාර්ගෝපදේශය ප්‍රකාරව වලංගු කාලය තුළදී කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරනු ලැබුවහොත් සැපයුම ප්‍රතික්ෂේප කිරීම වැළැක්වීම පිණිස ලංසුකරුවන්ගෙන් ලංසු සුරක්ෂණයන් ලබාගත යුතු වුවද, එකතුව රු.22,182,269 ක්වූ ඇණවුම් 12 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව රු.500,000 ක් ඉක්මවන භාණ්ඩ මිලදී ගැනීම සම්බන්ධයෙන් විධිමත් ගිවිසුමක් අත්සන් කළ යුතු වුවත්, එකතුව රු.260,534,582 ක්වූ ඇණවුම් 161 ක් සම්බන්ධයෙන් ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

### 3.11 හඳුනාගත් පාඩු

-----------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ලංසුවල වලංගු කාලය තුළ ගැනුම් ඇණවුම නිකුත් කිරීමට අපොහොසත් වීම නිසා පීවීසී ආලේපිත දම්වැල් මිලදීගැනීමේදී (PVC Coated Chain Link) රු.227,384 ක් සැපයුම්කරුට වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.

(ආ) 2015 මාර්තු 21 දින කිලෝ 25 ක කටුකම්බි රෝල් 300ක් මිලදීගැනීම සඳහා ලංසු කැඳවා තිබුණත්, රු.1,445,220 ක්වූ දෙවන අවම මිල ඉදිරිපත් කළ ආයතනයෙන් මිලදී ගැනීමට සුදුසු බවට 2015 මැයි 09 දින නැවත ඇගයීම් කමිටුව තීරණය කර තිබුණි. කෙසේ වෙතත් එම තීරණය අවලංගු කර නැවත 2015 මැයි 28 දින ලංසු කැඳවා එම මිලගණන් අධ්‍යනය කර නැවතත් එම ආයතනයෙන්ම රු.1,656,342 ක පිරිවැයට මිලදීගැනීම සුදුසු බව 2015 නොවැම්බර් 24 දින තීරණය කර තිබුණි.

(ඇ) නාවික හමුදාව විසින් මිලදී ගෙන තිබුණු රු.13,812,840 Driven Fire Pump 20 සැපයීම සඳහා දින 30 ක් ප්‍රමාදවීම හේතුවෙන් ගිවිසුම් ප්‍රකාරව අයවිය යුතු ප්‍රමාද ගාස්තුව වන රු.244,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.12 අනාර්ථික ගනුදෙනු

---------------------

ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් මාසිකව පරිභෝජනය කරනු ලබන විදුලිය වෙනුවෙන් ගෙවීම් ප්‍රමාද වීම නිසා ගෙවිය යුතු ගාස්තුවට අමතරව දඩ පොලිය වශයෙන් සමාලෝචිත වර්ෂයේදී රු.7,975,203 ක් ගෙවා තිබුණි. තවදුරටත් ගෙවිය යුතු හිඟ විදුලි ගාස්තුව රු.72,603,461 ක්වූ අතර මෙම හිඟ මුදල් නිරවුල් නොකිරීම හේතුවෙන් මාසික විදුලි බිලට එකතු වන පොලී මුදල තවදුරටත් ඉහළ යමින් පැවතුණි.

### 3.13 කළමනාකරණ දුර්වලතා

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නැගෙනහිර නාවික පෙදෙස මඟින් අළුත්වැඩියාව සඳහා යන්ත්‍ර හා උපකරණ විෂයයන් 06 ක් පිටස්තර ආයතනවලට භාරදී මාස 06 කට අධික කාලයක් ගතවී තිබුණත්, එම විෂයන්ගේ අළුත්වැඩියාවන් නිම කරවාගෙන නාවික හමුදාවට ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් යම් තොග විෂයයන්වල අවශ්‍යතාවය පළමුව තීරණය කර, මිල ගණන් කැඳවීමෙන් පසුව ඇණවුම් නිකුත් කිරීමට ආසන්නව තිබියදී, (වර්ෂයකට පමණ පසු) එම තොග විෂයයන් අවශ්‍ය නොවන බව තීරණය කරනු ලබන අවස්ථා පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය විය.

(ඇ) දකුණු නාවික පෙදෙසේ භාණ්ඩ (විෂයයන්) 244 ක් මිලදී ගැනීම් සඳහා එකතුව රු.9,630,730 ක් වූ ඇණවුම් පත් 244 ක් නිකුත් කර , 2016 දෙසැම්බර් මාසය වන විටත් වර්ෂයකට අධික

කාලයක් ගතවී තිබුණි. පසුව එම භාණ්ඩ (විෂයයන්) නාවික හමුදාව වෙත ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම එම නාවික පෙදෙසේ භාණ්ඩ (විෂයයන්) 88 ක් මිලදී ගැනීම සඳහා එකතුව රු. 10,809,712 ක් වූ ඇණවුම් පත් 88 ක් නිකුත් කර තිබුණත්, 2016 නොවැම්බර් මාසය අවසාන වන විට මාස 06 කට අධික කාලයක් ගතවී තිබුණත් අදාළ භාණ්ඩ නාවික හමුදාව වෙත ලැබී නොතිබුණි.

(ඇ) නැගෙනහිර නාවික පෙදෙසෙහි පිටත සවිකරන යන්ත්‍ර අළුත්වැඩියා අංශයට යන්ත්‍ර 10 ක් භාරදී වර්ෂයකට අධික කාලයක් ගතවී තිබුණත්, අළුත්වැඩියාවන් නිමකර නොතිබුණු අතර එයින් යන්ත්‍ර 04 ක් වර්ෂ 05කට වැඩි කාලයක සිට අළුත්වැඩියාවන් නිම කර නොතිබුණි.

(ඉ) බටහිර නාවික පෙදෙසෙහි එකතුව රු.8,490,597 ක් වටිනා යන්ත්‍ර උපකරණ හා සංගීත භාණ්ඩ මිලදීගැනීම සඳහා ඇණවුම් නිකුත් කර මාස 06 ක සිට මාස 12 ක් පමණ කාලයක් ගතවී තිබුණත් එම භාණ්ඩ නාවික හමුදාව වෙත ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) ලී බඩු උපකරණ හා කටුකම්බි (Wire barbed) මිලදීගැනීම සඳහා පිළිවෙලින් රු.2,246,640 ක් හා රු.1,088,751 ක් වටිනා ඇණවුම් නිකුත් කර මාස 06 කට වැඩි කාලයක් ගතවී තිබුණත්, එම භාණ්ඩ නාවික හමුදාව වෙත සැපයීමට සැපයුම්කරු අපොහොසත් වී තිබුණි.

(උ) 2016 නොවැම්බර් 30 දිනට නාවික හමුදාවේ බටහිර නාවික පෙදෙසෙහි අළුත්වැඩියාවන් සඳහා යොමු කළ වාහන 120 ක් අතරින් වාහන 24 ක් අළුත්වැඩියාවට යොමු කර වර්ෂයකට අධික කාලයක් ගතවී තිබුණත්, ඒවායේ අළුත්වැඩියා කටයුතු නිම කර නොතිබුණි

(ඌ) උතුරු මැද නාවික පෙදෙසෙහි මෝටර් රථ අළුත්වැඩියා අංශයේ දීර්ඝ කාලයක් මුළුල්ලේ අළුත්වැඩියා නොකරන ලද වාහන 08 ක් පැවතුණි. එයින් වාහන 03 ක් වර්ෂ 04 කට අධික කාලයක සිට අළුත්වැඩියා කළ නොහැකි තත්ත්වයක පැවතුණි.

(එ) උතුරු මැද නාවික පෙදෙසෙහි යන්මාර් 6L 2A – STP එන්ජින් අංශයට අළුත්වැඩියා කිරීමට භාරදී තිබූ යන්ත්‍ර 06 ක් අළුත්වැඩියා කිරීමට වර්ෂ 2 කට වැඩි කාලයක් ගත කර තිබුණි. තවද උතුරු මැද නාවික පෙදෙසෙහි යන්මාර් එන්ජින් අංශයට භාරදුන් වෙනත් යන්ත්‍ර 04 ක් වර්ෂ 02 කට අධික කාලයක් ගතවී තිබුණත් අළුත්වැඩියාවන් නිම කිරීමට අපොහොසත් වී තිබුණි.

(ඒ) උතුරු නාවික පෙදෙසෙහි නාවික මෝටර් ප්‍රවාහන වැඩපලෙහි හා කළාප අළුත්වැඩියා කාර්යාලයෙහි මාස 06 ක සිට මාස 25 ක කාලයක් මුළුල්ලේ අළුත්වැඩියා නොකරන ලද වාහන 21 ක් පැවතුණි.

(ඔ) උතුරු නාවික විධානයේ මාස 06 ක් ඉක්මවා තිබුණු නමුත් අළුත්වැඩියාවන් අවසන් කර නොතිබූ නාවික යාත්‍රා 08 ක් තිබුණි. තවද ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් උතුරු නාවික විධානයට අනුයුක්ත කරන ලද නාවික යාත්‍රාවක් මාස 06 ක කාලයක සිට අක්‍රිය තත්ත්වයේ පැවතුණි.

(ඕ) උතුරු නාවික පෙදෙසෙහි අළුත්වැඩියා කිරීමට භාරදී තිබූ යන්ත්‍ර හා උපකරණ 29 ක් අළුත්වැඩියා කිරීමට මාස 06 කට වැඩි කාලයක් ගත කර තිබුණි. එයින් යන්ත්‍ර හා උපකරණ 06 ක් වර්ෂ 04 කට වැඩි කාලයක් ගත වී තිබුණත්, අළුත්වැඩියාවන් නිම කර නොතිබුණි.

(ක) උතුරු නාවික විධානයේ අළුත්වැඩියා කිරීමට භාරදී තිබුණු පරිගණක 05 ක් මාස 06 ක් ඉක්මවා තිබුණු නමුත් අළුත්වැඩියාවන් අවසන් කර නොතිබුණි.

(ග) උතුරු නාවික පෙදෙසෙහි භාණ්ඩ (විෂයයන්) 202 ක් මිලදීගැනීම සඳහා වටිනාකම රු.18,853,362 ක් වූ ඇණවුම් 202 ක් නිකුත් කර තිබුණත් 2016 දෙසැම්බර් මාසය අවසන් දින වන විටත් එම භාණ්ඩ (විෂයයන්) නාවික හමුදාව වෙත ලැබී නොතිබුණි. එයින් රු.880,808 ක් වටිනා භාණ්ඩ (විෂයයන්) 41 ක් මාස 06 කට අධික කාලයක් ගත වී තිබුණු නමුත් අදාළ භාණ්ඩ නාවික හමුදාවට ලැබී නොතිබුණි.

(ජ) උතුරු නාවික පෙදෙස විසින් මිලදීගනු ලැබූ වටිනාකම රු.608,377 ක් වූ භාණ්ඩ (විෂයයන්) 25 ක් පිරිවිතරයන්ට අනුකූල නොවීම නිසා ආපසු යවා තිබුණු අතර 2017 ජනවාරි 31 දින වන විට මාස 01 ක සිට මාස 10 ක් දක්වා කාලයක් ගතවී තිබුණු නමුත් එම භාණ්ඩ නාවික හමුදාවට ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ට) උතුරු නාවික විධානයට අයත් ගබඩා තුළ රු.32,801,226 ක් වටිනා විෂයයන් 2602 ක් වර්ෂ 01 ක සිට වර්ෂ 04 ක් දක්වා කාලයක සිට නිකුත් නොවී පැවතුණි.

(ඩ) වයඹ නාවික පෙදෙසේ අක්‍රිය නෞකා හා නාවික යාත්‍රා 04 ක් පැවති අතර එයින් රු.මිලියන 7.2 ක් පිරිවැය වූ නාවික යාත්‍රා 2 ක් වර්ෂ 03 කට අධික කාලයක් ගතවී තිබුණත්, අළුත්වැඩියා කටයුතු අවසන් කර නොතිබුණි.

(ණ) වයඹ නාවික පෙදෙස මඟින් පිටස්තර ආයතනවලට අළුත්වැඩියා සඳහා ලබා දී තිබුණු යාත්‍රා 04 ක් සහ යන්ත්‍ර හා උපකරණ 05 ක් මාස 06 කට වැඩි කාලයක් ගතවී තිබුණත් අළුත්වැඩියා කටයුතු අවසන් කර නාවික හමුදාව වෙත භාර දී නොතිබුණි.

(ත) වර්ෂයක් ඉක්මවූ නමුත් අළුත්වැඩියාවන් අවසන් නොකළ යන්ත්‍ර 21 ක් වයඹ නාවික පෙදෙසේ අළුත්වැඩියා අංශවල පැවතුණි.

**3.14 මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

---------------------------------------------------

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

**නිල ඇඳුම් කාර්යය මණ්ඩලය**

-------------------------------

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | නිලධාරීන් | 3,577 | 3,027 | 577 | 27 |
| (ii) | නාවිකයන් | 51,423 | 52,126 | 5,436 | 6,139 |
| | **එකතුව** | **55,000** | **55,153** | **6,013** | **6,166** |

**සිවිල් කාර්යය මණ්ඩලය**

**----------------------------**

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** | **අතිරික්ත සංඛ්‍යාව** |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 08 | 08 | - | - |
| (ii) | තෘතියික මට්ටම | 10 | 04 | 06 | - |
| (iii) | ද්විතියික මට්ටම | 132 | 67 | 65 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 1,768 | 1,552 | 216 | - |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 214 | - | 214 |
| | **එකතුව** | **1,918** | **1,845** | **287** | **214** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

බඳවා ගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳව විධිමත් අනුමැතියක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.